www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මුම්බායිහි ත්‍රස්තවාදී වටලෑම පැය 59කට පසුව නිමාවට පත්වේ

**Terrorist siege of Mumbai ends after 59 hours**

**පීටර් සිමන්ඩ්ස් විසිනි**
**2008 නොවැම්බර් 29**

ඉන්දියානු කොමාන්ඩෝ භටයන් සුඛෝපභෝගී ටාජ් මහල් හෝටලය තුල රැඳී සිටි අවසන් තුවක්කුකරුවන් තිදෙනා මරා දැමීමත් සමග මුම්බායිහි වටලෑම අවසානයේ අද නිමාවට පත් විය. සියලු මෙහෙයුම් අවසාන වී ඇතැයි මුම්බාහි පොලිස් කොමසාරිස් හසාන් ගෆූර් මාධ්‍යවලට පැවසීය. ආරක්ෂක හමුදා භටයෝ තවමත් කාමරයෙන් කාමරයට සෝදිසි කරමින් සිටියහ. අවසන් ප්‍රහාරයේ දී එක් කොමාන්ඩෝ භටයෙක් මිය ගියේය.

හොඳින් සන්නද්ධව සිටි තුවක්කුකරුවන් බදාදා හැන්දෑවේ ඉන්දියාවේ මූල්‍ය මධ්‍යස්ථානය දෙවනත් කරන්ට පටන් ගත් අවස්ථාවේ සිට මේ දක්වා අඩු ගනනේ සිවිල් වැසියන් 160ක් මරා දමා 320කට වඩා තුවාල සිදු කොට තිබේ. එය සම්බන්ධයෙන් කවුරු වගකිව යුතු වුවත්, මෙම අහිංසක සිවිල් වැසියන් ඝාතනය මගින් සිදු විය හැක්කේ, ප්‍රෝඩාකාරී “ත්‍රස්ත විරෝධී යුද්ධය” නම් වෙස්පෑම යටතේ ඉන්දියාව හා ලොව වටා ප්‍රතිගාමීත්වය සඳහා ඉන්ධන සැපයීම පමනි.

පලමු ඉලක්කය වූයේ චත්‍රපාති ශිවාජී දුම්රිය ස්ථානයයි. එහි කඩා වැදුනු අඩු ගනනේ මිනිසුන් දෙදෙනෙකුගෙන් යුක්ත කන්ඩායමක් සෙනග පිරී සිටි ප්‍රධාන ශාලාව තුලට ඉවබවක් නැතිව ස්වයංක්‍රීය අවිවලින් වෙඩි තබමින් අත් බෝම්බ ද විසි කලේය. තරුන විදේශිකයන් සඳහා ප්‍රසිද්ධ ස්ථානයක් වන කැෆේ ලියෝපෝල්ඩ් ද ඉන් අනතුරුව චබාද්-ලිකොවිච් මධ්‍යස්ථානය පිහිටි නරිමාන් හවුස් ද ප්‍රහාරයට ලක් විය. කමා සහ අල්බ්ලෙස් කාන්තා හා ළමා රෝහලට පහර එල්ල වූ අතර ඉන් පසුව ටාජ් මහල් හෝටලය සහ තරු පහේ ඔබරෝයි-ට්‍රයිඩෙන්ට් හෝටලය ඉලක්ක කෙරුනි. තුවක්කුකරුවන් යන එන ගමන් ද වෙඩි ප්‍රහාර ගනනාවක් ම එල්ල කරන ලදි.

ඉන්දියානු පොලිස් හා ආරක්ෂක නිලධාරීන්ට අනුව, දුසිම් දෙකක තරම් ත්‍රස්තවාදීන් සංඛ්‍යාවක් විසින් එල්ල කරන ලද මෙම ප්‍රහාර හොඳින් සැලසුම් හා සම්බන්ධීකරනය කොට ක්‍රියාවට දමන ලදි. සෑම මිනිත්තු 15කට පමන වරක් නව ඉලක්කයකට පහර දී ආරක්ෂක හමුදාවන් නුසුදානම් තත්වයකට පත් කරනු වස් උපරිම අවුලක් හා ව්‍යාකූලත්වයක් නිර්මානය කෙරුනි. ඊයේ රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවක දී, ජ්‍යෙෂ්ඨ මෙරයින් කොමාන්ඩෝ නිලධාරියකු පැවසුවේ, සිය භටයන්ට වඩා හොඳින් තුවක්කුකරුවන් ටාජ් මහල් හෝටලයේ සැලසුම දැන සිටි බවයි. එම කන්ඩායම “බෙහෙවින් අධිෂ්ඨානවත්ව” සිටි බව විස්තර කල ඔහු ප්‍රහාරයන්ට පෙර හෝටල තුලට අවි හා පුපුරන ද්‍රව්‍ය හොරෙන් ගෙනවිත් තිබූ බව ද කියාපෑවේය.

ඊයේ හවස් වරුව වන විට, ඉන්දියානු ආරක්ෂක හමුදා ඔබරෝයි-ට්‍රයිඩෙන්ට් හෝටලයේ පාලනය සියතට ගෙන 100කට අධික අමුත්තන් පිරිසක් ආරක්ෂක ස්ථාන කරා ගෙන ගියහ. ඔවුන් හෝටල පරිශ්‍රයේ ආරක්ෂාව තහවුරු කල විට පොලිස් සහ කොමාන්ඩෝ භටයෝ අඩු ගනනේ මල සිරුරු 36ක් සොයා ගත්හ. දින දෙකකට ආසන්න කාලයක් තිස්සේ හමුදාවට එහි ලගාවීමට ඉඩ නොදෙමින් සිටි තුවක්කුකරුවන් දෙදෙනා මරා දමන ලදි. ඊයේ හැන්දෑවේ ඉන්දියානු කොමාන්ඩෝ භටයෝ, ත්‍රස්තවාදීන් දෙදෙනෙකු මරා දමමින්, යුදෙව් මූලධර්මවාදී චබාද්-ලිකොවිච් මධ්‍යස්ථානය වෙත කඩා වැදුනහ. ඇමරිකානු යුදෙව් පූජකයකු හා ඔහුගේ ඊශ්‍රායල බිරිඳ ඇතුලු ප්‍රාන ඇපකරුවන් පස් දෙනෙක් මිය ගොස් තිබී සොයා ගැනුනි.

සිද්ධීන් පිලිබඳ විස්තර තවමත් පවතින්නේ දල සටහනක් ලෙසය. ඊයේ හැන්දෑවේ මධ්‍යම ආන්ඩුවේ ස්වදේශ කටයුතු පිලිබඳ රාජ්‍ය ඇමති සිප්‍රකාශ් ජයිස්වාල් අනතුරු ඇඟවූයේ අවසන් මරන සංඛ්‍යාව 200 කරා ලගා විය හැකි බවටයි. තුවක්කුකරුවන් විශේෂයෙන් ම එක්සත් ජනපද හා බ්‍රිතාන්‍ය පුරවැසියන් ඉලක්ක කර ගත් බව ආරම්භක වාර්තා පෙන්නුම් කල නමුත්, මේ වන තෙක් මරනයට පත්ව ඇති අය අතරට ඇමරිකානුවන් පස් දෙනෙක් සහ බ්‍රිතාන්‍යයේ දෙදෙනෙක් මෙන් ම ප්‍රන්ස ජාතිකයන් දෙදෙනෙක්, ජර්මානුවන් තිදෙනක්, ඉතාලි වැසියෙක්, ජපන් ජාතිකයෙක්, ඕස්ට්‍රේලියානුවන් දෙදෙනෙක්, කැනේඩියානු වැසියෙක් සහ සිංගප්පූරු ජාතිකයෙක් ද ඇතුලත් ය. මරනයට ගොදුරුවූවන්ගෙන් අති මහත්

බහුතරයක් ඉන්දියානුවෝ වූහ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් චත්‍රපාති ෂිවාජි දුම්රිය ස්ථානයේ දී වෙඩි තබා ඝාතනය කරන ලදි.

ප්‍රහාර සඳහා වගකිව යුත්තේ කුමන සංවිධානය ද නැතහොත් සංවිධාන ද යන වග තවමත් පැහැදිලි නැත. බ්‍රහස්පතින්දා ඩෙකාන් මුජහිදීන් නමින් තමන්ව හඳුන්වා ගන්නා කලින් නොදැන සිටි කන්ඩායමක් වගකීම භාර ගත්තේය. මීට පෙර එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරවල දී මෙන්ම, මෙහි දී ද ඉන්දියානු ආන්ඩුව වහාම පකිස්ථානය වෙත ඇගිල්ල දිගු කොට තිබේ. විදේශ ඇමති ප්‍රනාබ් මුඛර්ජී මාධ්‍යවලට මෙසේ පැවසීය: "ප්‍රාථමික සාක්ෂ්‍ය, බැලූ බැල්මට පෙනෙන සාක්ෂ්‍ය, පෙන්නුම් කරන්නේ පකිස්ථානයට සබඳතා ඇති කොටස් මෙයට සම්බන්ධ බවයි."

ඉන්දියානු පුවත්පත් ගනනාවක් ම අත් අඩංගුවට ගත් තුවක්කුකරුවන් තිදෙනෙකුගෙන් පොලීසිය ප්‍රශ්න කිරීමේ දී ලබා ගත් විස්තර ලෙස ඔවුන් සඳහන් කල තොරතුරු පල කර තිබේ. හින්දු පත්‍රයට අනුව, අජ්මාල් අමීර් කමාල් ලෙස හඳුනාගෙන තිබූ පකිස්ථානු ජාතිකයෙක් පොලීසියට පවසා ඇත්තේ, තමන් සන්නද්ධ කාශ්මීර බෙදුම්වාදී කන්ඩායමක් වන ලෂ්කාර්-ඉ-ටයිබා සංවිධානයේ සාමාජිකයෙක් බවයි. ලෂ්කාර්-ඉ-ටයිබා හෝ තවත් කාශ්මීර සන්නද්ධ කන්ඩායමක් වන ජායිෂ්-ඉ-මොහොමඩ් ප්‍රහාරවලට සම්බන්ධ වෙන්ට ඉඩ ඇතැයි එක්සත් ජනපද නිලධාරින් ද චෝදනා කර ඇත. ලෂ්කාර්-ඉ-ටයිබා ප්‍රහාරයට තමන්ගේ කිසිදු සම්බන්ධයක් නැති බව පවසමින් ප්‍රකාශයක් නිකුත් කර තිබේ.

තමන් සහ තවත් 11 දෙනෙක් වෙළඳ නෞකාවකින් පකිස්ථානයේ කරච්චි වරායෙන් පිටත් වී පසුව ඉන්දියානු නාවික හමුදාව සහ වෙරලාරක්ෂක භට හමුදාව මග හරිනු පිනිස ධීවර බෝට්ටුවක් පැහැර ගෙන මුම්බායි කරා ලගා වූ බව කමාල් තමන්ගෙන් ප්‍රශ්න කල නිලධාරින්ට පවසා ඇතැයි හින්දු පත්‍රය කියාපෑවේය. ඉන්දියානු නාවික හමුදාව පකිස්ථානු භාන්ඩ ප්‍රවාහන නැව් දෙකක් නතර කොට පරීක්ෂා කල අතර සැක කටයුතු කිසිවක් සොයා ගත නොහැකි වූ තතු යටතේ ඉන් එකක් නිදහස් කර තිබේ. මුම්බායිහි ආරක්ෂක නිලධාරින් හුලං පුරවා පා කල හැකි කුඩා යාත්‍රාවක් ප්‍රදර්ශනය කොට ඇති අතර ඔවුන් කියාපෑවේ එය තුවක්කුකරුවන් කන්ඩායමක් වෙරල කර ලගා වීම පිනිස යොදා ගෙන ඇති බවයි.

කෙසේ වෙතත්, මේ අවස්ථාවේ දී, ප්‍රහාර සඳහා වගකිව යුත්තේ කුමන සංවිධානය ද යන්න නිශ්චිතව පෙන්නුම් කරන කිසිදු සාක්ෂ්‍යයක් නිකුත් කොට නැත. ප්‍රහාරවලට තමන්ගේ කිසිදු සම්බන්ධයක් නැති බව දෘඩතර ලෙස ප්‍රකාශ කර ඇති පකිස්ථාන ආන්ඩුව දෙරට අතර ආතතීන් ඇවිලවීමට ක්‍රියා නොකරන ලෙස ඉන්දියාවට ආයාචනා කර තිබේ. ඉස්ලාමාබාද් ආන්ඩුව, සද්භාවයේ සලකුනක් ලෙස, පරීක්ෂනවලට සහාය වනු පිනිස පකිස්ථානයේ මිලිටරි බුද්ධි අංශයේ ප්‍රධානියා -- අන්තර් සේවා බුද්ධි අංශයේ (අයිඑස්අයි) ප්‍රධානි ලුතිනන් ජෙනරාල් අහමඩ් ෂුජා පෂා -- ඉන්දියාවට එවන ලෙස නව දිල්ලිය කර ඇති ඉල්ලීමට එකග වී ඇත.

කලින් සැලසුම් කෙරුනු සංචාරයක් සඳහා ඉන්දියාවට පැමින තිබූ පකිස්ථාන විදේශ ඇමති මෙහමූද් ක්‍යුරෙස්ති මෙසේ ප්‍රකාශ කලේය: "අපි මෙයට කිසිදු සම්බන්ධයක් නැහැ. මේ වගේ දෙයකට සම්බන්ධ වීමේ කිසිදු අවශ්‍යතාවක් අපට නැහැ." ප්‍රගාඪ ආර්ථික අර්බුදයට මුහුන පා සිටින, ඇෆ්ඝනිස්ථානයට යාබද ප්‍රදේශවල ඉස්ලාම් සටන්කාමීන්ට එරෙහිව වඩ වඩා දරුනු අතට හැරෙන යුද්ධයක පැටලී සිටින පකිස්ථාන ආන්ඩුව මෙම ත්‍රස්ත ප්‍රහාරවලට සෘජුව සම්බන්ධ වීමට ඇති ඉඩකඩ ඉතා අඩුය. ඉස්ලාමාබාද් පාලනය උත්සාහ කරන්නේ, නව දිල්ලිය විරසක කර ගැනීමට නොව, ඉන්දියාව සමග ආතතීන් සමනය කර ගැනීමටය. ප්‍රථමයෙන් ප්‍රහාරයක් එල්ල කිරීම බැහැර නොකරන පකිස්ථානයේ පෙර පැවති න්‍යෂ්ටික පිලිවෙත පසුගිය සති අන්තයේ දී ජනාධිපති අසිෆ් අලි සර්දාරි විසින් වෙනස් කරනු ලැබ ඇති බවක් පෙනී යයි.

කෙසේ වෙතත්, හිතාමතාම ඉන්දියාව සමග ආතතීන් ඇවිලවීමේ හා දැනටමත් අස්ථායි පකිස්ථාන ආන්ඩුව අස්ථාවර කිරීමේ විධික්‍රමයක් ලෙස පකිස්ථාන අයිඑස්අයි සංවිධානයේ හෝ මිලිටරියේ විපරීමතධාරී කොටස් මුම්බායි ප්‍රහාරවලට උල් පන්දම් දී ඇතුවා විය හැකි ය. ඇෆ්ඝනිස්ථානයේ එක්සත් ජනපද මිලිටරි වාඩිලෑමට ආන්ඩුව දෙන සහයෝගය ද "ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම" යන කඩතුරාව යටතේ ඇෆ්ඝනිස්ථානයට යාබද දේශසීමා ප්‍රදේශවල එක්සත් ජනපද-විරෝධී කැරලිකරුවන් මර්දනය කරනු පිනිස තමන් මෙහෙයවනු ලැබීම ද පිලිබඳව හමුදාවේ කොටස් ගැඹුරු ලෙස වික්ෂෝප වී සිටී. කාරනාව මෙය යයි ඔප්පු වුව හොත්, මුම්බායිහි භයංකර සිද්ධීන්, කලාපය පුරා එක්සත් ජනපද මිලිටරිවාදයේ ගැඹුරින් ම අස්ථායිකාරක බලපෑම සහ සාපරාධී ක්‍රියාකලාපය පිලිබඳ තවත් ප්‍රදර්ශකයක් වනු ඇත.

ලෂ්කාර්-ඉ-ටයිබා වැනි කාශ්මීර බෙදුම්වාදී කන්ඩායමක් ප්‍රහාර සඳහා වගකිව යුතු වීමට ද ඉඩ ඇත. යුදෙව් මධ්‍යස්ථානයේ සිටි එක් තුවක්කුකරුවෙක් සාකච්ඡාවක් ඉල්ලා සිටිනු පිනිස ඊයේ ඉන්දියානු රූපවාහිනී මධ්‍යස්ථානයකට දුරකතනයෙන් කතා කර ඇති බවක් පෙනී යාම අර්ථභාරී ය. "කාශ්මීරයේ දී කොපමන මිනිසුන් සංඛ්‍යාවක් මරා දමා ඇති බව ඔබ දන්නවාද? ඔබගේ හමුදාව මුස්ලිම්වරු මරා දමා ඇති ආකාරය ඔබ දන්නවාද? මේ සතියේ දී කාශ්මීරයේ දී ඔවුන් කීදෙනක් මරා දමා ඇති බව ඔබ දන්නවාද?" යයි ඔහු විමසීය.

ඉන්දියානු පාලනය යටතේ පවතින ජම්මු හා කාශ්මීර ප්‍රාන්තය තුල ඉන්දියානු හමුදාවේ ක්‍රියාකලාපය මුම්බායිහි ඉවබවක් නැති ඝාතන කිසිදු අයුරකින් යුක්තියුක්ත නොකරන නමුදු, මුස්ලිම් බහුතරයකින් යුක්ත මෙම ප්‍රාන්තය තුල දශක ගනනාවක් තිස්සේ පවත්නා ගෙන යන මර්දනය, විවිධාකාර කාශ්මීර බෙදුම්වාදි හා ඉස්ලාම්වාදී සංවිධානවලට බැඳීමට සූදානම් සාමාජිකයන් සපයන වෛරයේ හා අමනාපයේ ගැඹුරු උල්පතක් නිර්මානය කර ඇත. පසුගිය සිකුරාදා ඉන්දියානු බලධාරිහු කාශ්මීරයේ දශක දෙකකට ආසන්න කැරලිකාරිත්වයෙන් හටගෙන ඇති මරන සංඛ්‍යාව 47,000කට වැඩි අගයක් දක්වා ආරෝහන අතට සංශෝධනය කලහ. කාශ්මීරයේ සටන්කාමින් යයි සැකකෙරෙන පුද්ගලයන් අධිකරන ක්‍රියාදාමයට පරිබාහිරව මරා දැමීම, හිතුවක්කාරී ලෙස රඳවා ගැනීම සහ වධබන්ධනයට ලක් කිරීම සම්බන්ධයෙන් ඉන්දියානු ආරක්ෂක හමුදාවෝ කුප්‍රකට ය.

පසුගිය සතියේ, ප්‍රාන්ත මැතිවරනවල දෙවන වටයට එරෙහිව උද්ඝෝෂනය කරන විරෝධතාකරුවන් සමග පොලීසිය සහ පැරා-මිලිටරි සොල්දාදුවන් ගැටීමත් සමග කලාපයේ ආතතීන් යලිත් ඇවිලුනි. මෙම විරෝධතා පැනනැංගේ, කාශ්මීරයේ හින්දු සිද්ධස්ථානයකට ඉඩමක් ලබා දීමේ ඉන්දියානු ආන්ඩුවේ ප්‍රකෝපකාරී තීන්දුව මගින් අවුලුවන ලද මාස ගනනාවක දේශපාලන ගැටුමෙන් පසුව ය.

අවසාන වසයෙන් කිව යුත්තේ, මුම්බායි ප්‍රහාර, රටේ විශාල මුස්ලිම් සුලුතරයට එරෙහිව වෙනස්කම් කිරීමේ දශක ගනනාවක වැඩපිලිවෙල මගින් පෝෂනය කරන ලද, ඉන්දියාව තුලම පදනම් වූ ඉස්ලාම්වාදී කන්ඩායම්වල වැඩක් ය යන්න ද බැහැර කල නොහැකි බවයි. ඉන්දියානු සංස්ථාපිතයට වර්ගෝත්තමවාදය මත ඇති රදාපැවැත්ම පිලිබඳ නිදර්ශනය නම්, පසුගිය දශක දෙක තිස්සේ හින්දු අධිපතිවාදී භාරතීය ජනතා පක්ෂයේ (බීජේපී) දේශපාලනික නැගීමයි. ඉන්දියානු මුස්ලිම්වරු ජනගහනයේ දුප්පත්ම සහ වඩාත්ම පරිපීඩිත ස්ථරවලට අයත් වන අතර බීජේපීය සහ සෙසු හින්දු උන්මත්තකයන් විසින් මෙහෙයවනු ලබන වාර්ගික ජනඝාතනවල ඉලක්කයක් බවට ද ඔවුහු පත්ව ඇත.

මුම්බායිහි සිද්ධීන්ට කවුරු වගකිව යුතු වුවත්, එම ත්‍රස්තවාදී සාහසික ක්‍රියාව ඉන්දියාව සහ ජාත්‍යන්තරව ආන්තික දක්ෂිනාංශයේ අත් ශක්තිමත් කිරීමට ඍජුවම දායක වී ඇත. ඉන්දියානු මාධ්‍ය, ව්‍යාපාරික නායකයන් සහ දේශපාලනඥයෝ ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීමේ නාමයෙන් දැඩි නව ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රම දැනටමත් ඉල්ලමින් සිටිති. ඉන්දියානු හමුදාව තුල සිටින හින්දු අන්තවාදීන් ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාරවලට සම්බන්ධ වී ඇති බවට එලිදරව් වී ඇති කරුනුවලින් අවධානය අපසරනය කරනු වස් බීජේපී නායක එල්.කේ. අද්වානි මෙම අවස්ථාව වහාම ඩැහැගත්තේ ය. ඉන්දියානු ආරක්ෂක හමුදා හින්දු ත්‍රස්තවාදීන් පිලිබඳව "මුලුමනින් ම අවධානය යෙදීම" නිසා ඉස්ලාම්වාදීන්ගෙන් එල්ල වන තර්ජන ඔවුන්ට මග හැරී ඇතැයි ඔහු ප්‍රකාශ කලේය.

එමෙන් ම, ත්‍රස්තවාදී ප්‍රහාර දකුනු ආසියාවේ න්‍යෂ්ටිකව සන්නද්ධ ප්‍රතිවාදීන් දෙදෙනා -- ඉන්දියාව හා පකිස්ථානය -- අතර ආතතීන් නාටකාකාර ලෙස උත්සන්න කිරීමට තුඩු දීමේ අන්තරායක් ද පවතී. මෙම රටවල් දෙක ම සිය සහයෝගී පදනම්වලට මුක්කු ගසා ගනු වස් වර්ගෝත්තමවාදය ඇවිලවීමේ යෙදී සිටී. කාශ්මීර බෙදුම්වාදීන් විසින් 2001 දෙසැම්බරයේ දී ඉන්දියානු පාර්ලිමේන්තු ගොඩනැගිල්ලට එල්ල කරන ලද ප්‍රහාරයකින් අනතුරුව, දෙරටම හමුදා සේනාංක බලමුලු ගන්වාගෙන විවෘත පරිමාන යුද්ධයක මුවවිටට පැමිනියේ ය. ඔවුන් සිය සේනාංක ඉවත් කර ගත්තේ, ජාත්‍යන්තර පීඩනය යටතේය. පකිස්ථානයේ අස්ථායි තන්ත්‍රයක් පැවතීම සහ ඉන්දියාවේ ඊලඟ වසරේ ජාතික මැතිවරන පැවැත්වීමට නියමිතව ඇති යටතේ, මුම්බායි ප්‍රහාරවලින් පසුව, ඊට සමාන තත්වයක් ඇවිලීමේ විභවයක් පවතී.

© www.wsws.org